# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2130/16 - 2019 ජූලි මස 03 වැනි බදාදා - 2019.07.03**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1980 අංක 45 දරන පනතින් සංශෝධනය කරන ලද 1971 අංක 47 දරන ජාතික චිත්‍රපට සංස්ථා පනතේ බලතල ප්‍රකාරව ජාතික චිත්‍රපට සංස්ථාව සතු චිත්‍රපට බෙදාහැරීමේ සියලු බලතල සංස්ථාව විසින්ම ක්‍රියාත්මක කිරීම.**

1980 අංක 45 දරන පනතින් සංශෝධිත, 1971 අංක 47 දරන ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා පනතේ 57 වන වගන්තිය යටතේ බලතල ප්‍රකාරව සභාපති විසින් නිකුත් කරනු ලැබූ නිවේදනයයි.

චිත්‍රපට බෙදහැරීමේ කාර්යය පෞද්ගලික බෙදහැරීමේ මණ්ඩල වෙත පවරමින් බෙදහැරීමේ සමාගම් සමග සංස්ථාව එළඹ තිබූ ගිවිසුම්/අවබෝධතාවය බල රහිත සහ ශූන්‍ය බවට පත්කරමින් 2018.06.19 දින ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා සභාපති විසින් බෙදහැරීමේ මණ්ඩල වෙත කරනු ලැබූ දැනුම්දීම අත්හිටුවමින් පෞද්ගලික බෙදහැරීමේ මණ්ඩල විසින් ගොනු කරනු ලැබූ අංක DSP 99/2018 දරන නීති කෘත්‍යයට අදළව ජාතික චිත්‍රපට සංස්ථාවට එරෙහිව නිකුත් කර තිබූ වාරණ නියෝගය විසුරුවා හැර ඇති අතර පෞද්ගලික බෙදහැරීමේ මණ්ඩල විසින් ජාතික චිත්‍රපට සංස්ථාවට එරෙහිව සිදුකරන ලද අතුරු තහනම් නියෝගයක් සඳහා වූ ඉල්ලීම ද ගරු අධිකරණය විසින් ප්‍රතික්ෂේප කර ඇත.

ඉහත නීති කෘත්‍ය පදනම් කරගෙන ශ්‍රී ලංකාව තුළ දේශීය/විදේශීය චිත්‍රපට බෙදහැරීමේ කාර්යය වඩා විධිමත්ව සිදුකිරීමට 1980 අංක 45 දරන පනතින් සංශෝධිත, 1971 අංක 47 දරන ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා පනතේ 57 වන වගන්තිය යටතේ සංස්ථා සභාපති වශයෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පෞද්ගලික බෙදහැරීමේ මණ්ඩල විසින් ක්‍රියාත්මක කරනු ලැබූ දේශීය/විදේශීය චිත්‍රපට බෙදහැරීමේ බලතල 2019 ජුනි මස 18 වන දින සිට අවලංගු කරන බව දැනුම් දෙනු ලබන අතර, එම දින සිට සිනමාශාලා සඳහා චිත්‍රපට අනුපෙළ ගැන්වීම, චිත්‍රපට ප්‍රදර්ශනය සඳහා චිත්‍රපට මුදහැරීමේ සහ චිත්‍රපට බෙදහැරීමේ දී ලැබෙන ආදයම එක්රැස් කිරීම ඇතුළු චිත්‍රපට බෙදහැරීමට අදළ සියළු කාර්යයන් සම්පූර්ණයෙන් ම ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව විසින් සිදු කරන බව ප්‍රකාශයට පත්කරමි.

අනූෂා ගෝකුල ප්‍රනාන්දු,
සභාපති,
ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව.

2019 ජූනි මස 18 වන දින දී ය.


1A - PG 4580 — 517 (2019/07)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

චිත්‍රපට බෙදාහැරීම හා ප්‍රදර්ශන ක්‍රමවේදය

**ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව**

1. **හැඳින්වීම :**

1980 අංක 45 දරන පනතින් සංශෝධිත, 1971 අංක 47 දරන ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා පනතේ 57 වන වගන්තිය යටතේ සංස්ථාවේ සභාපති වශයෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව, පෞද්ගලික බෙදාහැරීමේ මණ්ඩල විසින් ක්‍රියාත්මක කරනු ලැබූ දේශීය/ආනයනික චිත්‍රපට බෙදාහැරීමේ බලතල 2019 ජූනි මස 18 වන දින සිට අවලංගු කරමින්, එම දින සිට සිනමාශාලා සඳහා චිත්‍රපට අනුපෙළ ගැන්වීම, චිත්‍රපට ප්‍රදර්ශනය සඳහා චිත්‍රපට මුදාහැරීම සහ චිත්‍රපට බෙදාහැරීමේදී ලැබෙන ආදායම එක්රැස් කිරීම ඇතුළු චිත්‍රපට බෙදාහැරීමට අදාළ සියළුම කාර්යයන් සම්පූර්ණයෙන්ම සංස්ථා පනතේ බලතල ප්‍රකාරව ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව විසින් සිදු කරනු ලබයි.

2. **ක්‍රමවේදය :**

ශ්‍රී ලංකාව තුළ චිත්‍රපට බෙදාහැරීම (මෙහි මින්මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව විසින් කළ යුතුය.

1980 අංක 45 දරන පනතින් සංශෝධිත 1971 අංක 47 දරන ජාතික චිත්‍රපට සංස්ථා පනතේ විධිවිධාන මත සංස්ථාව වෙත ලැබී ඇති බලතල ප්‍රකාරව චිත්‍රපට බෙදාහැරීම හා ප්‍රදර්ශනය කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් ක්‍රමවේදයන් අනුගමනය කළ යුතුය.

2.1 සංස්ථා පනතේ විධිවිධාන මත සංස්ථාව වෙත ලැබී ඇති බලතල ප්‍රකාරව මෙම නියමයන් ප්‍රකාශයට පත්කරන අතර එකී නියමයන් තත් පරිදි පිළිපැදීම සඳහා සියලුම පාර්ශවයන් බැඳී සිටියි.

2.2 චිත්‍රපට ලියාපදිංචි කිරීමේ ක්‍රමය

2.2.1 දේශීය චිත්‍රපට ලියාපදිංචි කිරීම.

සිනමාශාලා තුළ ප්‍රදර්ශනය කිරීමට අපේක්ෂිත සෑම දේශීය චිත්‍රපටයක් ම සංස්ථාවේ විධිමත්ව ලියාපදිංචි කළ යුතුය.
දේශීය චිත්‍රපට ලියාපදිංචි කිරීමේ ක්‍රමවේදය ඇතුළත් ලේඛනය අමුණා ඇත. (ඇමුණුම - 01)

2.2.2 චිත්‍රපට ආනයනය
විදේශීය චිත්‍රපට ආනයනය කිරීමට පෙර සංස්ථාව විසින් නිකුත් කරනු ලබන, චිත්‍රපට ආනයනය කිරීමේදී අනුගමනය කළ යුතු කොන්දේසි මාලාව සපුරාලමින් ලියාපදිංචි ආනයනකරුවන් විසින් (මෙහි මින්මතු සභාපති" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවේ සභාපතිගේ ලිඛිත අනුමැතිය ලබා ගත යුතුය.

2.3 විධිමත්ව ලියාපදිංචි කරන ලද දේශීය චිත්‍රපට හෝ ආනයනය කරන ලද චිත්‍රපට, සංස්ථාව විසින් ප්‍රදර්ශනය සඳහා පෙළ ගස්වනු ලැබේ.

2.4 චිත්‍රපට වර්ගීකරණය සහ පෙළ ගැස්වීම සඳහා පහත කරුණු සම්පූර්ණ කළ යුතුය.

2.4.1 **දේශීය චිත්‍රපට**

2.4.1.1 ප්‍රදර්ශනය සඳහා අපේක්ෂිත දේශීය චිත්‍රපට, සංස්ථා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විධිමත්ව පත්කරනු ලබන (මෙහි මින්මතු "ඇගැයීම් මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) දේශීය චිත්‍රපට ඇගයීම් මණ්ඩලයක් වෙත වර්ගීකරණය සඳහා ඉදිරිපත් කළ යුතුය.
ඇගයීම් මණ්ඩලයේ සංයුතිය සඳහන් ලේඛනය අමුණා ඇත. (ඇමුණුම - 02)

2.4.1.2 එකී ඇගයීම් මණ්ඩලය විසින් එම මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලබන චිත්‍රපට නරඹා, එම චිත්‍රපට පහත පරිදි වර්ගීකරණය කරනු ලැබේ.
* කලාත්මක-ආකර්ෂණීය ලක්ෂණ සහිත චිත්‍රපට,
* වාණිජමය-ආකර්ෂණීය ලක්ෂණ සහිත චිත්‍රපට,
* කලාත්මක-ආකර්ෂණීය සහ වාණිජමය-ආකර්ෂණීය ලක්ෂණ සම්මිශ්‍රිත චිත්‍රපට,

එකී ඇගැයීම් මණ්ඩලය විසින් සකස් කරන ලද වර්ගීකරණයට අදාළ නිර්ණායක ඇතුළත් ලේඛනය අමුණා ඇත. (ඇමුණුම - 03)

ඉහත වර්ගීකරණයට ඇතුළත් නොවන චිත්‍රපට සිනමාශාලාවන් හි ප්‍රදර්ශනය සඳහා අනුපෙළ ගන්වනු නොලැබේ. එවැනි අවස්ථාවන් හී චිත්‍රපටයේ නිෂ්පාදක හට අභියාචනයක් ඉදිරිපත් කිරීම සඳහා (මෙහි මින්මතු "අභියාචනා මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) දේශීය චිත්‍රපට ඇගැයීම් අභියාචනා මණ්ඩලයක් පත් කර ඇත.

එම අභියාචනා මණ්ඩලයේ සංයුතිය සඳහන් ලේඛනය අමුණා ඇත. (ඇමුණුම - 04)

2.4.1.3 ඉහත ඇගයීම් මණ්ඩලය මඟින් වර්ගීකරණය කරනු ලබන දේශීය චිත්‍රපට, නිෂ්පාදක විසින් ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

2.4.1.4 ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩල සහතිකය ලබා ඇති චිත්‍රපට අනුපෙළ ගැන්වීම සහ බෙදාහැරීම සඳහා නිෂ්පාදක විසින් සංස්ථාව වෙත බාර දිය යුතුය.

2.4.1.5 නිෂ්පාදක විසින් බාර දෙනු ලබන එකී චිත්‍රපට, (මෙහි මින්මතු "චිත්‍රපට සංචිතය" ලෙස සඳහන් කරනු ලබන.) ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩල සහතිකයේ දිනයේ අනුපිළිවෙල පරිදි ප්‍රදර්ශනයට නියමිත චිත්‍රපට සංචිතයට ඇතුළත් කරනු ඇත.

2.4.1.6 සිනමාශාලා වෙත චිත්‍රපට මුදාහැරීමට අනුපෙළ ගැන්වීම සඳහා වන නිර්දේශ ලබාගැනීම වෙනුවෙන් (මෙහි මින්මතු "අනුපෙළ ගැන්වීමේ කමිටුව" යනුවෙන් සඳහන් කරනු ලබන) දේශීය චිත්‍රපට අනුපෙළ ගැන්වීමේ කමිටුවක් පත් කරනු ලැබේ.
අනුපෙළ ගැන්වීමේ කමිටුවේ සංයුතිය සඳහන් ලේඛනය අමුණා ඇත. **(ඇමුණුම - 05)**

2.4.2 **ආනයනික චිත්‍රපට**

2.4.2.1 ජාතික චිත්‍රපට සංස්ථා ආනයන පිළිවෙත අනුව ආනයනය කරනු ලබන සියලුම චිත්‍රපට ආනයනකරු විසින් සංස්ථාවට බාර දිය යුතුය.

2.4.2.2 එසේ බාර දෙනු ලබන චිත්‍රපට, සංස්ථාව විසින් ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලයේ අනුමැතිය සඳහා යොමු කරනු ලබයි.

2.4.2.3 ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලය සහතිකය ලද චිත්‍රපට, සංස්ථාව විසින් බෙදාහැරීමට කටයුතු කරනු ලබයි.

3. ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලය විසින් අයකරනු ලබන සම්මත ගාස්තු චිත්‍රපට නිෂ්පාදක/ආනයනකරු විසින් දැරිය යුතු වේ.

4. ජාතික චිත්‍රපට කර්මාන්තය තුළ චිත්‍රපට බෙදාහැරීම විධිමත් කිරීම සඳහා දැනට දේශීය චිත්‍රපට ප්‍රදර්ශනය කරනු ලබන සිනමාශාලා, කාණ්ඩ තුනකට වෙන් කර බෙදාහැරීමේ ධාරාවන් තුනක් ලෙස ක්‍රියාත්මක කරනු ඇත. **(ඇමුණුම - 06)** එතෙකුදු වුවද විශේෂිත චිත්‍රපටයක් **(ඇමුණුම - 07)** සඳහා නිෂ්පාදකගේ ඉල්ලීම මත ඇගැයීම් මණ්ඩලයේ නිර්ණායක පදනම්ව දෙනු ලබන නිර්දේශ මත හා අනුපෙළ ගැන්වීමේ කමිටුවේ නිර්දේශ මත චිත්‍රපට ප්‍රදර්ශනය සඳහා සංස්ථා සභාපතිගේ ලිඛිත අනුමැතිය පරිදි එක් ධාරාවක සිනමාශාලා අනෙකුත් ධාරා වලට අනුයුක්ත කර උපරිම සිනමාශාලා සංඛ්‍යාවක් ලබා දීමට සංස්ථාව අවස්ථානුකූලව කටයුතු කරනු ඇත.

5. ඉහත ධාරා තුන යටතේ ප්‍රදර්ශනය සඳහා අනුපෙළ ගන්වන දේශීය චිත්‍රපට ප්‍රථම මුදාහැරීමේදී සිනමා ශාලාවල සංප්‍රවර්ථනීය සංඛ්‍යාවට (**Holdover Figure**) යටත්ව පළමු සති දෙක තුළ අඛණ්ඩව අවම ප්‍රධාන දර්ශන වාර තුනක් පවත්වාගෙන යායුතුය. (පෙ.ව.10.30, ප.ව.1.30/2.30 සහ ප.ව. 6.30/7.00)

6. ඉහත ධාරා තුන යටතේ පවතින සිනමාශාලා වල ප්‍රදර්ශනය සඳහා අනුපෙළ ගන්වනු ලබන දේශීය චිත්‍රපටයේ අවම දර්ශන වාර තුනට අමතරව වෙනත් දර්ශන වාර වලදී දේශීය හෝ ආනයනික චිත්‍රපටයක් ප්‍රදර්ශනය කිරීමේ අවස්ථාව හිමි වේ.

7. ආනයනික චිත්‍රපට, ඉහත දේශීය චිත්‍රපට ප්‍රදර්ශනය කරනු ලබන ධාරාවලට පරිබාහිරව ආනයනික චිත්‍රපට ප්‍රදර්ශනය කරනු ලබන සිනමා ශාලා වල ප්‍රදර්ශනය කරනු ඇත. **(ඇමුණුම - 08)**

8. එකී ආනයනික චිත්‍රපට ප්‍රදර්ශනය කරනු ලබන සිනමා ශාලා වල ඉල්ලීම පරිදි දේශීය චිත්‍රපට ප්‍රදර්ශනය සඳහා අවස්ථාව සලසා දෙනු ඇත.

9. ඉහත ඇගැයීම් මණ්ඩලය විසින් වර්ගීකරණය කරන ලද ,

- කලාත්මක-ආකර්ෂණීය ලක්ෂණ සහිත චිත්‍රපට,
- වාණිජමය-ආකර්ෂණීය ලක්ෂණ සහිත චිත්‍රපට,
- කලාත්මක-ආකර්ෂණීය සහ වාණිජමය-ආකර්ෂණීය ලක්ෂණ සම්මිශ්‍රිත චිත්‍රපට

දේශීය චිත්‍රපට ප්‍රදර්ශනය කරනු ලබන ධාරා තුන යටතේ සිනමා ශාලවල ප්‍රදර්ශනය සඳහා කටයුතු කරනු ඇත.

ඒ අනුව, වර්ගීකරණයට ලක් වූ නිර්මාණ ධාරා තුන යටතේ සමව බෙදී යන අයුරින් පහත පරිදි අනුපෙළ ගන්වනු ඇත.

| | *ධාරා 01* | *ධාරා 02* | *ධාරා 03* |
|---|---|---|---|
| පළමු අවස්ථාව | කලාත්මක-ආකර්ෂණීය ලක්ෂණ සහිත චිත්‍රපට | වාණිජමය-ආකර්ෂණීය ලක්ෂණ සහිත චිත්‍රපට | කලාත්මක - ආකර්ෂණීය සහ වාණිජමය- ආකර්ෂණීය සම්මිශ්‍රිත චිත්‍රපට |
| දෙවන අවස්ථාව | කලාත්මක-ආකර්ෂණීය සහ වාණිජමය-ආකර්ෂණීය සම්මිශ්‍රිත චිත්‍රපට | කලාත්මක-ආකර්ෂණීය ලක්ෂණ සහිත චිත්‍රපට | වාණිජමය-ආකර්ෂණීය ලක්ෂණ සහිත චිත්‍රපට |
| තෙවන අවස්ථාව | වාණිජමය-ආකර්ෂණීය ලක්ෂණ සහිත චිත්‍රපට | කලාත්මක-ආකර්ෂණීය සහ වාණිජමය-ආකර්ෂණීය සම්මිශ්‍රිත චිත්‍රපට | කලාත්මක-ආකර්ෂණීය ලක්ෂණ සහිත චිත්‍රපට |

උදා : කලාත්මක-ආකර්ෂණීය ලක්ෂණ සහිත චිත්‍රපට - X
වාණිජමය-ආකර්ෂණීය ලක්ෂණ සහිත චිත්‍රපට - Y
කලාත්මක-ආකර්ෂණීය සහ වාණිජමය-ආකර්ෂණීය සම්මිශ්‍රිත චිත්‍රපට - Z ලෙසසැලකුවහොත්,

| | *ධාරා 01* | *ධාරා 02* | *ධාරා 03* |
|---|---|---|---|
| පළමු අවස්ථාව | X | Y | Z |
| දෙවන අවස්ථාව | Z | X | Y |
| තෙවන අවස්ථාව | Y | Z | X |

10. චිත්‍රපට සංචිතය තුළින් ධාරා ක්‍රමය යටතේ ප්‍රදර්ශනය සඳහා අනුපෙළ ගන්වනු ලබන චිත්‍රපට, ඒ ඒ ධාරා යටතේ පවත්වාගෙන යන අතර, අවම වශයෙන් එක් ධාරාවක් යටතේ චිත්‍රපට 05ක් අනුපෙළ ගැන්වීමට කටයුතු කළ යුතුය. (ඒ අනුව සෑම විටම ධාරා තුන යටතේ චිත්‍රපට 15ක් අනුපෙළ ගැන්වූ පොරොත්තු ලේඛනයක් පවත්වාගෙන යා යුතුය.) අංක : 04 ඡේදයේ විධි විධාන වලට යටත්ව මෙම කරුණ ක්‍රියාත්මක කරනු ලැබේ.

11. යම් විශේෂ අවස්ථාවකදී යම් ධාරාවකට සීමිත පිටපත් සංඛ්‍යාවක් සහිත චිත්‍රපටයක් කෙටි කාල සීමාවකට මුදාහැරීමට අවශ්‍ය වන්නේ නම්, ඒ සම්බන්ධයෙන් ඇගැයීම් මණ්ඩලයේ නිර්දේශ මත හා අනුපෙළ ගැන්වීමේ කමිටුවේ නිර්දේශ මත සභාපතිගේ ලිඛිත අනුමැතිය පරිදි ධාරාවේ ප්‍රධාන මුදහැරීමට බාධාවක් නොවන ලෙස අදාළ චිත්‍රපටය මුදාහැරිය හැකිය.

12. ධාරා ක්‍රමය යටතේ ප්‍රදර්ශනය සඳහා අනුපෙළ ගන්වන ලද චිත්‍රපට අනුපිළිවෙල, යම් පිළිගත හැකි කරුණු මත හැරුනු විට සංශෝධනය නොකරන අතර එසේ සංශෝධනයක් සිදු කිරීමට අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා සභාපතිගේ ලිඛිත අවසරය ලබා ගත යුතුය. (පිළිගත හැකි කරුණු සඳහන් ලේඛනය අමුණා ඇත. - ඇමුණුම 09)

13. එසේ වුවද ඉහත කී පිළිගත හැකි කරුණු නොමැතිව යම් චිත්‍රපටයක් තම ප්‍රදර්ශන වාරය ලබා නොගන්නා විට එම චිත්‍රපටය ඉහත අංක. 10 හි සඳහන් පොරොත්තු ලේඛනයේ අවසානයට ඇතුලත් කළ යුතු වන අතර එසේ තම වාරය ලබා නොගැනීමේ අවස්ථාව වාර 2කට පමණක් සීමා විය යුතුය.

14. එක් එක් ධාරාව යටතේ අනුපෙළ ගන්වනු ලැබූ චිත්‍රපට අතරින් එක් චිත්‍රපටයක් ප්‍රදර්ශනය සඳහා මුදාහැර සති දෙකක් ඇතුළත සංචිතයෙන් නව චිත්‍රපටයක් ඒ ඒ ධාරාවන් තුලට අනුපෙළ ගන්වනු ඇත. එම ක්‍රමය අඛණ්ඩව ක්‍රියාත්මක කරනු ඇත.

15. එක් එක් ධාරාවල ප්‍රදර්ශනය සඳහා අනුපෙළ ගන්වා ඇති චිත්‍රපටවල පූර්ව ප්‍රචාරක පටය අවම වශයෙන් අනුගාමී චිත්‍රපට දෙකෙහිදී ප්‍රදර්ශනය සඳහා කටයුතු කරනු ලබන අතර පූර්ව ප්‍රචාරක පට ප්‍රදර්ශනය සඳහා සිනමා ශාලාවට හෝ වෙනත් කිසිදු පාර්ශවයකට මුදල් නොගෙවිය යුතුය.

චිත්‍රපටයට අදාළ සියළුම ප්‍රචාරක කටයුතු නිෂ්පාදකගේ අභිමතය පරිදි සිදුකළ හැකිය. පූර්ව ප්‍රචාරක කටයුතු සංස්ථාව මඟින් අපේක්ෂා කරන්නේ නම් පහත සඳහන් පරිදි කටයුතු කළ යුතුය.

15.1 පූර්ව ප්‍රචාරක පටය, ඊළඟ මුදාහැරීම් දෙකෙහි පළමු මුදාහැරීමට සති දෙකකට පෙර ද,
15.2 ෆොටෝ කාඩ්ස් දෙවන මුදාහැරීමට සති දෙකකට පෙර ද,
15.3 පෝස්ටර් සහ ප්‍රධාන ප්‍රචාරක පුවරු (cutouts) අදාළ චිත්‍රපටය මුදාහැරීමට සති දෙකකට පෙර ද,
සිනමාශාලා වෙත යැවීම සඳහා සංස්ථාවට බාරදිය යුතුය.

ඉහත පරිදි ප්‍රචාරක ද්‍රව්‍ය ලබා නොදෙන චිත්‍රපටවල ප්‍රචාරණය සම්බන්ධයෙන් සංස්ථාව වග නොකියන අතර, එවැනි අවස්ථා වලදී චිත්‍රපටයේ පූර්ව ප්‍රචාරක කටයුතු නිෂ්පාදකවරයාගේ අභිමතය පරිදි සිදුකර ගැනීමක් සේ සැලකේ.

16. මුදාහැරීමට නියමිත අදාළ දේශීය චිත්‍රපට, මුදාහැරීමට සති දෙකකට පෙර ද, ආනයනික චිත්‍රපට, බෙදාහැරීම සඳහා ප්‍රමාණවත් කාලයකට පෙරද, සංස්ථාවට බාර දිය යුතුය. (35 mm / DCP පිටපත්)

17. මුදාහැරීමට නියමිත දේශීය චිත්‍රපට සහ ආනයනික චිත්‍රපට ප්‍රදර්ශනයට ප්‍රථම, චිත්‍රපටයේ නිෂ්පාදක/ආනයනකරු, සංස්ථාව සමග විධිමත් බෙදාහැරීමේ ගිවිසුමකට එළඹිය යුතු අතර එම ගිවිසුම උල්ලංඝණය නොකළ යුතුය.

18. සෑම සිනමා ශාලාවක් ම නිසි පරිදි සම්පූර්ණ කරන ලද දෛනික වාර්තා සහ එදින චිත්‍රපටය ප්‍රදර්ශනයෙන් ලද දෛනික ආදායමෙන් සංස්ථාවට ප්‍රේෂණය කළ යුතු කොටස ඊළඟ දිනයේදී සංස්ථාවට යොමු කළ යුතු අතර, එසේ නොකරන සිනමා ශාලා වෙත ප්‍රදර්ශනයට නියමිත ඊළඟ චිත්‍රපටය සැපයීම අත්හිටුවීමට කටයුතු කරනු ඇත.

19. අදාළ සිනමා ශාලා වෙතින් එක් එක් චිත්‍රපටයට අදාළව සංස්ථාවට ප්‍රේෂණය කරනු ලබන මුදලින්, නිෂ්පාදකගේ කොටස චිත්‍රපටය ප්‍රදර්ශනය වී දින 45 ක් තුළ ගෙවීමට කටයුතු කරනු ඇත.

20. ධාරාවන් තුළ මුදාහරිනු ලබන චිත්‍රපට ප්‍රදර්ශනයෙන් ඉවත් වීමේදී මුදාහැර ඇති චිත්‍රපටයේ සංප්‍රවර්ථනීය සංඛ්‍යාව( Holdover Figure) තව දුරටත් බල පැවැත්වේ.

21. උපායමාර්ගික සංවර්ධන ව්‍යාපෘතින් ( Strategic Development Projects) යටතේ ක්‍රියාත්මක වන සිනමාශාලා සඳහා ගාස්තු හා බෙදාහැරීමේ ව්‍යුහය සංස්ථාව සමඟ එළඹෙනු ලබන අවබෝධතා ගිවිසුම් වලට අනුව තීරණය කරනු ඇත.

22. සිනමා කර්මාන්තය අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා මෙම ක්‍රමවේදය බලාත්මක වුවද සංස්ථාවේ බෙදාහැරීම්, අලෙවි නිෂ්පාදන පර්යේෂණ හා විමර්ශන අංශ වලට ඇති වන ප්‍රායෝගික ගැටළුකාරී තත්ත්වයන් සම්බන්ධයෙන් එකී අංශ මඟින් පර්යේෂණාත්මකව හා විද්‍යානුකූලව ඉදිරිපත් කරනු ලබන නිරීක්ෂණ හා නිර්දේශ සලකා බලා මෙම ක්‍රමවේදය කාලීනව සංශෝධනය කරනු ඇත.

23. එමෙන්ම නිෂ්පාදකයින්, ආනයනකරුවන්, අධ්‍යක්ෂකවරුන්, සිනමාශාලාහිමියන්, කළමනාකරුවන්, කලා ශිල්පීන් ඇතුලු ක්ෂේත්‍රයට අදාළ සියලු පාර්ශවයන් සහ සිනමා කර්මාන්තයේ ප්‍රගමනය හා ප්‍රවර්ධනය අපේක්ෂා කරන කවර හෝ පුද්ගලයෙක් හෝ සංවිධානයක් හෝ ඉදිරිපත් කරනු ලබන තාර්කික හා විද්‍යානුකූලවූත් පොදු එකඟතා සහිතවූත් සමස්ත සිනමා කර්මාන්තයේ දියුණුව වෙනුවෙන් කවර ආකාරයේ අදහස් හා යෝජනා සංස්ථාව විසින් සලකා බලන අතර ඒ අනුව මෙම ක්‍රමවේදය කාලීනව සංශෝධනය කරනු ඇත.

24. චිත්‍රපට ප්‍රදර්ශනය හා බෙදාහැරීමේ ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් නිකුත් කරනු ලබන චක්‍රලේඛ/මාර්ගෝපදේශ ඇතුළු සියලු කරුණු සංශෝධනය කිරීම, අවලංගු කිරීම හා තීරණය කිරීමේ බලය සභාපති සතු වේ.

25. චිත්‍රපට බෙදාහැරීම විධිමත්ව ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් නිකුත් කරනු ලබන ක්‍රමවේදයට අදාළව ඕනෑම කරුණකදී සභාපති විසින් ගනු ලබන තීරණය අවසානාත්මක වේ.

26. මෙම ලේඛනයේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පිටපත් අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවැනි අවස්ථාවක සිංහල භාෂා පිටපත බලාත්මක වේ.

පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මේ ක්‍රමවේදයෙහි :-

"පනත" යන්නෙන්, 1980 අංක 45 දරන පනතින් සංශෝධිත 1971 අංක 47 දරන ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා පනත අදහස් වේ.
"ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව" යන්නෙන්, 1980 අංක 45 දරන පනතින් සංශෝධිත 1971 අංක 47 දරන ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා පනත යටතේ පිහිටවනු ලැබූ ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව අදහස් වේ.
"චිත්‍රපටය" යන්නෙන්, දේශීය හෝ ආනයනික චිත්‍රපටයක් අදහස් වේ.

ව්‍යතිරේඛය :-

1980 අංක 45 දරන පනතින් සංශෝධිත 1971 අංක 47 දරන ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා පනතේ බලතල ප්‍රකාරව, සිනමාශාලා සඳහා චිත්‍රපට අනුපෙළ ගැන්වීම, චිත්‍රපට ප්‍රදර්ශනය සඳහා චිත්‍රපට මුදාහැරීම හා චිත්‍රපට මුදාහැරීමේදී ලැබෙන ආදායම එක්රැස් කිරීම ඇතුළු චිත්‍රපට බෙදාහැරීමට අදාළ සියළු කාර්යයන් සම්බන්ධයෙන් ඊට අනුෂාංගික වූ වෙනත් අදාළ වන රෙගුලාසි පසුවට නිකුත් කරනු ලැබේ.

අනූෂා ගෝකුල ප්‍රනාන්දු,
සභාපති,
ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව.

පිටපත : ලේකම්,
නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය - කරු. දැ.ගැ.ස.

ඇමුණුම - 01

NFC/102/01/01

### දේශීය චිත්‍රපට ලියාපදිංචිය

(1) සෑම චිත්‍රපටයක්ම නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීමට පෙර ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ ලියාපදිංචි කළ යුතු ය. ලියාපදිංචි ගාස්තුව රු. 5000/- කි.

(2) අදාළ අයදුම්පත හා උපදෙස් ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ නිෂ්පාදන අංශයෙන් ලබා ගත හැකි අතර, www.nfc.gov.lk වෙබ් අඩවිය තුළින් ද බාගත හැකි වේ.

(3) චිත්‍රපටය ලියාපදිංචි කිරීම සඳහා පහත ලේඛන සම්පූර්ණ කර ඉදිරිපත් කළ යුතු ය.

3.1 ලියාපදිංචි කිරීමේ අයදුම් පත්‍රය (ඇමුණුම 01 - I)

3.2 තනි පුද්ගල/ව්‍යාපාර/සමාගම් ලියාපදිංචි සහතිකයේ සහතික කරන ලද ඡායා පිටපතක්

3.3 නිෂ්පාදකගේ ජාතික හැඳුනුම්පත්‍රයේ ඡායා පිටපතක්

3.4 හවුල් ව්‍යාපාරයක් නම් ව්‍යාපාරයේ සිටින සාමාජිකයින් අතරින් එක් සාමාජිකයෙකු ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව සමග ගනුදෙනු සඳහා අනෙකුත් සාමාජිකයන් විසින් නම් කර බලය පවරන ලද ලිපියක්

3.5 චිත්‍රපටයට සම්බන්ධ ප්‍රධාන නළු/නිළි, අධ්‍යක්ෂ, කැමරා ශිල්පී, සංස්කරණ ශිල්පීන් සමග එළඹ ඇති ගිවිසුම් පිටපත්

3.6 චිත්‍රපටයේ කතා සාරාංශය

3.7 ඉදිරිපත් කරන කතා සාරාංශය නව නිර්මාණයක් බවට දිවුරුම් සහතිකයක්

(4) චිත්‍රපට සංස්ථාවේ ලියාපදිංචිය නොලබා චිත්‍රපටයේ නිෂ්පාදන කටයුතු ආරම්භ නොකළ යුතු අතර, එසේ ලියාපදිංචි නොකරන ලද චිත්‍රපට බෙදාහැරීම සඳහා කටයුතු කරනු නොලැබේ.

(5) චිත්‍රපටය ප්‍රදර්ශනය සඳහා ප්‍රසිද්ධ රැගුම් පාලක මණ්ඩලය වෙත ඉදිරිපත් කර අදාළ සහතිකය ලබා ගත යුතු ය.

(6) ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව මඟින් අනුමත වී ඇති ක්‍රමවේදයන්ට අනුව චිත්‍රපටය අනුපෙළ ගැන්වීමට කටයුතු කරනු ලැබේ.

(7) ප්‍රසිද්ධ රැගුම් පාලක මණ්ඩලය විසින් ප්‍රදර්ශනය සඳහා අනුමත කරන ලද චිත්‍රපටයේ පිටපතක් ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තු සංරක්ෂණාගාරයේ තැන්පත් කිරීම සඳහා ජාතික චිත්‍රපට සංස්ථාවේ චිත්‍රපට ගබඩා සංරක්ෂණ ඒකකය වෙත ලබා දිය යුතු ය.

(8) චිත්‍රපටය ප්‍රදර්ශනය ආරම්භ කර වසරක් ගතවන තෙක් රූපවාහිනී සහ වෙනත් මාධ්‍යයකින් ප්‍රදර්ශනය සහ DVD පට නිෂ්පාදනය සපුරා තහනම්ය.

(9) චිත්‍රපටය නිෂ්පාදනය සඳහා ලියාපදිංචි වී ඇති නිෂ්පාදකගේ/නිෂ්පාදන සමාගමේ දුරකථන අංක (ස්ථාවර/ජංගම) හා ස්ථිර ලිපිනය වෙනස් වන අවස්ථාවක එම තොරතුරු ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාට දැනුම් දිය යුතු ය.

(10) චිත්‍රපටයේ අයිතිය (නිෂ්පාදක/නිෂ්පාදන සමාගම) වෙනස් වන අවස්ථාවක නොපමාව ඒ පිළිබඳ තොරතුරු ලිඛිතව ජාතික චිත්‍රපට සංස්ථාවට දැනුම් දිය යුතු අතර, ඊට අදාළ ලිපි/ලේඛනවල සහතික කළ පිටපත් ද ඉදිරිපත් කළ යුතු ය.

(11) චිත්‍රපටයක නම සංශෝධනය කිරීම සඳහා රු. 3000/- ක මුදලක් ජාතික චිත්‍රපට සංස්ථාවට ගෙවිය යුතු ය.

(12) දේශීය චිත්‍රපට සඳහා විදේශීය රංගන ශිල්පීන් සහ තාක්ෂණික ශිල්පීන් යොදා ගනු ලබන අවස්ථාවන්හි දී චිත්‍රපට සංවර්ධන අරමුදලට පහත පරිදි ගෙවීම් කළ යුතු ය.

ප්‍රධාන රංගන ශිල්පී/ප්‍රධාන කාර්මික ශිල්පී - රු. 250,000.00

සහාය රංගන ශිල්පී/සහාය කාර්මික ශිල්පී - රු. 100,000.00

(13) චිත්‍රපට වර්ගීකරණ කමිටුවේ තීරණ සඳහා එකඟ විය යුතු ය.

(14) ලියාපදිංචි කරනු ලබන සෑම චිත්‍රපටයක්ම ප්‍රදර්ශනය කිරීම සඳහා ජාතික චිත්‍රපට සංස්ථාව බැඳී නොමැත.

සභාපති,
ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව.

2019.06.28

| කාර්යාල ප්‍රයෝජනය සඳහා පමණි |
|---|
| |

ඇමුණුම - 01 - I

එන්එෆ්සී/102/01/01

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

**දේශීය චිත්‍රපට නිෂ්පාදනය කිරීම සඳහා ලියාපදිංචිවීමේ ඉල්ලුම් පත්‍රය.**

01. චිත්‍රපටයේ නම :........................................................................................................................................

02. නිෂ්පාදකගේ සම්පූර්ණ නම ලිපිනය සහ දුරකථන අංකය : ........................................................................

........................................................................................................................................................................

03. ලියාපදිංචි කරන ලද සමාගමේ/ව්‍යාපාරයේ නම සහ ලිපිනය : .....................................................................

........................................................................................................................................................................

04. ව්‍යාපාරය ලියාපදිංචි කළ අංකය සහ දිනය : .................................................................................................

(මුල් පිටපත සමග නීතිඥවරයෙකු/සමාදාන විනිශ්වයකාරවරයෙකු විසින් සහතික කළ ඡායා පිටපතක් ඉදිරිපත් කළ යුතුය)

05. නිෂ්පාදක/සමාගම/හවුල්කරුවන් මෙතෙක් නිපදවා ඇති චිත්‍රපට පිළිබඳ විස්තරය :-

| චිත්‍රපට ප්‍රදර්ශන දිනය | ණය ලබාගෙන තිබේ නම් ආයතනය | ණය පියවූ බව හෝ හිඟ තිබේ නම් ප්‍රමාණය |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |

06. නිෂ්පාදනය කරන චිත්‍රපටය පිළිබඳව විස්තර:

I. තිරනාටක රචකගේ නම සහ ලිපිනය :........................................................................................

........................................................................................................................................

II. චිත්‍රපටයේ භාෂාව : .............................................................................................................

III. චිත්‍රපටයේ කැමරා ශිල්පියාගේ නම සහ ලිපිනය : ....................................................................

........................................................................................................................................

IV. චිත්‍රපටයේ සංගීත අධ්‍යක්ෂකගේ නම හා ලිපිනය : ...................................................................

........................................................................................................................................

V. ගීත රචක /රචකයන්ගේ නම /නම් සහ ලිපිනය:..........................................................................

........................................................................................................................................

........................................................................................................................................

VI. ගායක /ගායිකාවන් ගේ නම් සහ ලිපිනය :...............................................................................

........................................................................................................................................

VII. චිත්‍රපටයේ සංස්කරණ ශිල්පියාගේ නම සහ ලිපිනය .................................................................

........................................................................................................................................

VIII. චිත්‍රපටයේ වේෂ නිරූපන ශිල්පියාගේ නම සහ ලිපිනය : ...........................................................

........................................................................................................................................

IX. චිත්‍රපටයේ කලා අධ්‍යක්ෂකගේ නම සහ ලිපිනය : .....................................................................

........................................................................................................................................

X. චිත්‍රපටයේ නිෂ්පාදන කළමනාකරුගේ නම සහ ලිපිනය : ...........................................................

........................................................................................................................................

07. චිත්‍රපට අධ්‍යක්ෂකවරයාගේ නම සහ ලිපිනය සහ මීට පෙර ඔහු හෝ ඇය අධ්‍යක්ෂණය/සහය අධ්‍යක්ෂණය කළ චිත්‍රපට පිළිබඳ විස්තර :............................................................................................................
.....................................................................................................................................................
.....................................................................................................................................................
.....................................................................................................................................................

08. චිත්‍රපටයේ ප්‍රධාන දේශීය නළු නිළියන්ගේ නම් සහ ලිපිනයන් :..........................................................
.....................................................................................................................................................
.....................................................................................................................................................
.....................................................................................................................................................

09. චිත්‍රපටය සඳහා විදේශීය නළු නිළියන් සම්බන්ධවන්නේ නම් ඔවුන්ගේ නම සහ ලිපිනයන් ...............................
.....................................................................................................................................................
.....................................................................................................................................................
.....................................................................................................................................................

10. වෙනත් කරුණු : ..................................................................................................................................
.....................................................................................................................................................
.....................................................................................................................................................
.....................................................................................................................................................
.....................................................................................................................................................

වෙළඳ ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේ සහතිකය, කථා සාරාංශය සහ ප්‍රධාන නළු නිළි ,කාර්මික ශිල්පීන් සමඟ ඇතිකර ගත් ගිවිසුම් වල පිටපත් මේ සමඟ ඉදිරිපත් කරමි/කරමු.

මා/අප විසින් නිෂ්පාදනය කිරීමට අපේක්ෂිත චිත්‍රපටය පිළිබඳව ඉහත සදහන් කර ඇති විස්තර සත්‍ය බවට සහතික කරන අතර, මෙම චිත්‍රපටය නිෂ්පාදනය කිරිම සදහා සංස්ථාවේ අනුමැතිය ලබා දී ලියාපදිංචි කරන මෙන් ඉල්ලා සිටිමි/සිටිමු.

එමෙන්ම ජාතික චිත්‍රපට සංස්ථාව දේශීය චිත්‍රපට නිෂ්පාදනය සහ ප්‍රදර්ශනය කිරීම සම්බන්ධව අනුගමනය කරන ප්‍රතිපත්තීන්ට එකඟවන බවත්, මාගේ දැනීමේ හැටියට ඉහත කරුණු සත්‍ය බවත් සඳහන් කරමි/ කරමු.

.....................................................
.....................................................
.....................................................

මුද්‍රාව :-
දිනය :-

ඇමුණුම - 02

NFC/108/AGM/01/2019/01

**දේශීය චිත්‍රපට ඇගයීම් මණ්ඩලය.**

ජාතික චිත්‍රපට සංස්ථාවේ ලියාපදිංචි කර නිෂ්පාදනය අවසන් කර ඇති චිත්‍රපට සිනමා ශාලා සඳහා ප්‍රථම වර්ගීකරණය සිදු කිරීම සඳහා පහත ක්ෂේත්‍රයන් නියෝජනයෙන් කමිටුවක් පත් කරනු ලැබේ.

1. මානව විද්‍යාව /සමාජ විද්‍යාව
2. මනෝ විද්‍යාව/උපදේශනය
3. අපරාධ විද්‍යාව / නීති ක්ෂේත්‍රය
4. පරිසරවේදය /සෞන්දර්යය
5. අධ්‍යාපනවේදය / ශික්ෂණවේදය
6. තාක්ෂණවේදය
7. ව්‍යාපාර කළමනාකරණය / අලෙවිකරණය
8. වෛද්‍යවේදය/ සෞඛ්‍ය අධ්‍යාපනය
9. විශ්ව විද්‍යාල නියෝජනය (උපරිම තිදෙනෙක්)

උක්ත ක්ෂේත්‍රයන් නියෝජනය කරමින් පත්වන කමිටුව විසින් චිත්‍රපටයක් නරඹා වර්ගීකරණය කිරීම සඳහා අවම වශයෙන් කමිටු සාමාජිකයින්ගේ ගණපූර්ණය තිදෙනෙක් විය යුතුය.

සාමාන්‍යාධිකාරී,
ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව.

2019.06.28 දින.

ඇමුණුම - 03

NFC/108/AGM/01/2019/2

**දේශීය චිත්‍රපට ඇගයීම් මණ්ඩලය මඟින් චිත්‍රපට වර්ගීකරණයට පාදක කරගන්නා නිර්ණායක.**

මෙම ඇගයීම් මණ්ඩලය විසින් අදාළ චිත්‍රපට නරඹා,

- කලාත්මක-ආකර්ෂණීය ලක්ෂණ සහිත චිත්‍රපට
- වාණිජමය-ආකර්ෂණීය ලක්ෂණ සහිත චිත්‍රපට
- කලාත්මක-ආකර්ෂණීය සහ වාණිජමය-ආකර්ෂණීය ලක්ෂණ සම්මිශ්‍රිත චිත්‍රපට.
- උක්ත වර්ගීකරණ කාණ්ඩ වලට ඇතුළත් නොවන චිත්‍රපට,

වශයෙන් චිත්‍රපට වර්ගීකරණය සිදු කරනු ලැබේ.

පහත නිර්ණායක මත පදනම්ව චිත්‍රපට වර්ගීකරණය සිදු කිරීම.

I. චිත්‍රපටයේ සිනමාත්මකභාවය (Cinematography)
II. චිත්‍රපටයේ කලාත්මක සහ සෞන්දර්යාත්මක වටිනාකම (Artistic and esthetic Value)
III. චිත්‍රපටයේ වාණිජ වටිනාකම (Commercial value)
IV. තිර රචනය (Screenplay)
V. ශිල්පීය වටිනාකම (Cast Value)
VI. වර්ණ ගුණාත්මකභාවය (Colour Quality)
VII. ශ්‍රව්‍ය ගුණාත්මකභාවය (Audio Quality)
VIII. දෘශ්‍ය ගුණාත්මකභාවය (Visual Quality)
IX. අධ්‍යක්ෂණය (Directing)
X. තාක්ෂණිකභාවය (Technology)

සාමාන්‍යාධිකාරී,
ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව.

2019.06.28 දින.

ඇමුණුම - 04

NFC/108/AGM/01/2019/03

**දේශීය චිත්‍රපට ඇගයීම් අභියාචනා මණ්ඩලය.**

දේශීය චිත්‍රපට ඇගයීම් මණ්ඩලයේ කමිටු සාමාජිකයින් විසින් චිත්‍රපට නරඹා, සිනමාශාලාවල ප්‍රදර්ශනය සඳහා තෝරා ගනු ලබන්නේ කලාත්මක-ආකර්ෂණීය ලක්ෂණ සහිත චිත්‍රපට, වාණිජමය-ආකර්ෂණීය ලක්ෂණ සහිත චිත්‍රපට හා කලාත්මක-ආකර්ෂණීය සහ වාණිජමය-ආකර්ෂණීය ලක්ෂණ සම්මිශ්‍රිත චිත්‍රපට යන කාණ්ඩ වලට ඇතුලත් වන චිත්‍රපටයි.

නමුත් එම ඇගයීම් මණ්ඩලයෙන් සිනමාශාලාවල ප්‍රදර්ශනයට තෝරා නොගන්නා චිත්‍රපට උක්ත කාණ්ඩ 3ට ඇතුලත් නොවන චිත්‍රපට වේ. එවැනි අවස්ථාවකදී අදාළ තීරණයන් චිත්‍රපටයේ නිෂ්පාදකවරයා විසින් පිළිනොගන්නේ නම් අභියාචනයක් ඉදිරිපත් කිරීමේ හැකියාවක් ඔහුට ඇත. ඒ සඳහා දේශීය චිත්‍රපට ඇගයීම් අභියාචනා මණ්ඩලයක් පවතී.

මෙම දේශීය චිත්‍රපට අභියාචනා මණ්ඩලයේ සංයුතිය පහත පරිදි වේ.

- දේශීය චිත්‍රපට ඇගයීම් මණ්ඩලයේ අදාළ චිත්‍රපටය නැරඹීමට සහභාගි නොවුණු එක් සාමාජිකයෙක්
- චිත්‍රපට අනුපෙළ ගැන්වීමේ කමිටුවේ සාමාජිකයන් දෙදෙනෙක් (අදාළ කමිටුවට පත්කර ඇති සාමාජිකයන්ගෙන්, සිනමාශාලා හිමියන් නියෝජනයක් හා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත සංස්ථා සභාපති විසින් පත්කරන ලද ස්වාධීන සාමාජිකයන් තිදෙනාගෙන් එක් අයෙක් නියෝජනය විය යුතුය)

සාමාන්‍යාධිකාරී,
ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව.

2019.06.28 දින.

ඇමුණුම - 05

NFC/108/AGM/01/2019/04

**චිත්‍රපට අනුපෙළ ගැන්වීමේ කමිටුවේ සංයුතිය.**

චිත්‍රපට සිනමාශාලාවන් හී ප්‍රදර්ශනයට අනුපෙළ ගැන්වීම සඳහා නිර්දේශ ලබාදීම මෙම කමිටුවේ කාර්යභාරය වන අතර එහි සාමාජිකයින්ගේ සංයුතිය පහත පරිදි වේ.

- සිනමාශාලා 5කට නොඅඩුව දේශීය චිත්‍රපට ප්‍රදර්ශනය කරමින් පවත්වාගෙන යනු ලබන සියලුම සිනමාශාලා හිමියන් හෝ බදුකරුවන්ගෙන් සමන්විත නියෝජනයන්
- දේශීය චිත්‍රපට ප්‍රදර්ශනය කරන ඉහත අංක 01 ට අදාළ නොවන අනෙකුත් සිනමා ශාලා නියෝජනය කරමින් එක් පළාතකට එක් නියෝජිතයෙකු බැගින්.
- අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත සංස්ථා සභාපති විසින් පත්කරනු ලබන ස්වාධීන පුද්ගලයින් තිදෙනෙක්.

සාමාන්‍යාධිකාරී
ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව.

2019.06.28 දින.

ඇමුණුම - 06

NFC/114/03/47

**යෝජිත ධාරා සැලැස්ම**

| | 1 | | 2 | | 3 |
|---|---|---|---|---|---|
| 1 | රීගල් - කොළඹ | 1 | සැවෝයි ප්‍රීමියර් - වැල්ලවත්ත | 1 | ලිඩෝ - බොරැල්ල |
| 2 | රිට්ස් - බොරැල්ල | 2 | සැවෝයි - රාජගිරිය | 2 | නැෂනල් - මහරගම |
| 3 | ඇම්ප්ලයිට් - මහරගම | 3 | අනූෂා - මහරගම | 3 | සිනෙස්ටා - අනුරාධපුරය |
| 4 | විජේන්ද්‍රා - අනුරාධපුරය | 4 | විල්මැක්ස් - අනුරාධපුරය | 4 | ලක්බිම - කුළියාපිටිය |
| 5 | මහලේකම් - කුළියාපිටිය | 5 | ශ්‍රී මහල් - කුළියාපිටිය | 5 | දොන්ස් ප්ලාසා - කළුතර |
| 6 | ප්‍රිස්කා - කළුතර | 6 | නිව් මිනර්වා - කළුතර | 6 | එන්.අයි.ටී - රත්නපුර |
| 7 | ජෝති රත්නපුර | 7 | නිව් ටවුන් - ඇඹිලිපිටිය | 7 | එමෙස් - මොරටුව |
| 8 | ටවර් - මොරටුව | 8 | මැක්ස්ලයිට් - මොරටුව | 8 | ජීවන් - පානදුර |
| 9 | මාෂා - පානදුර | 9 | වින්ස් - වාද්දුව | 9 | සැවෝයි මෙට්රෝ- ගම්පහ |
| 10 | පබ්ලික් හෝල් - ගම්පහ | 10 | නයෝමි - ගම්පහ | 10 | හිමාලි - කිරිබත්ගොඩ |
| 11 | කන්ට්‍රාස් - දළුගම | 11 | නිකාඩෝ - කඩවත | 11 | සිනෙක්ස්පෝ - කුරුණෑගල |
| 12 | සමනල - මැල්සිරිපුර | 12 | එන්.අයි.ටී - කුරුණෑගල | 12 | මිලානෝ ඩයමන්ඩ් - කෑගල් |
| 13 | ටාසන් - කෑගල්ල | 13 | මිලානෝ ගෝල්ඩ් - කෑගල්ල | 13 | ආනන්ද - ගම්පොළ |
| 14 | ජයබිම - ගම්පොළ | 14 | සන්ධ්‍යා - ගම්පොළ | 14 | ස්කයිලයිට් -මාතර |
| 15 | එස්. කේ - මාතර | 15 | නිව් සිනමා - මාතර | 15 | රීගල් - අම්බලන්ගොඩ |
| 16 | ක්වීන්ස් - ගාල්ල | 16 | ප්‍රින්ස් - ගාල්ල | 16 | ජයලත් - කටුනායක |
| 17 | රෝයල් - මීගමුව | 17 | ඇන්ඩෘ - මීගමුව | 17 | සිනෙමැක්ස් - ජා - ඇල |
| 18 | විස්ටාලයිට් - ජා - ඇල | 18 | රූ සිනමා - කටුනායක | 18 | රමෝගා - වෙන්නප්පුව |
| 19 | නීලා - දංකොටුව | 19 | ෂැම්රොක් - වෙන්නප්පුව | 19 | සීගිරි - වේයන්ගොඩ |
| 20 | ගැමුණු - නිට්ටඹුව | 20 | ඔසාකාලයිට් - නිට්ටඹුව | 20 | ටීජී - කඩුවෙල |
| 21 | විජයන්ති - කඩුවෙල | 21 | නිව් රේබා - කඩුවෙල | 21 | ලේබා - හෝමාගම |
| 22 | මෙට්රෝ - නුගේගොඩ | 22 | ඔඩියන් - ගල්කිස්ස | 22 | සීගිරි - බණ්ඩාරවෙල |
| 23 | රෙක්ස් - බදුල්ල | 23 | සිනෙල්මා - බදුල්ල | 23 | සාගර - හලාවත |

**යෝජිත ධාරා සැලැස්ම** *(සම්බන්ධිතයි)*

| | 1 | | 2 | | 3 |
|---|---|---|---|---|---|
| 24 | රමෝගා - හලාවත | 24 | සිනේසිටි දර්ශන - කොස්වාඩිය | 24 | නිව් ජානකී - මතුගම |
| 25 | නිව් චම්පිකා - ඉංගිරිය | 25 | දුල්මිණි - හොරණ | 25 | ස්කයිලයිට් - පිළියන්දල |
| 26 | ජයසේකර - සූරියවැව | 26 | සමන්තා - දෙමටගොඩ | 26 | සිනෙමාල් - අලව්ව |
| *27 | ධනසිරි - වරකාපොළ | 27 | සරසවි - අලව්ව | *27 | නිව් ලයින් - දඹුල්ල |
| 28 | ඊ.ඩී.සී - කැකිරාව | 28 | රාණි - කැකිරාව | 28 | නිව් නන්දා - නිකවැරටිය |
| 29 | ශ්‍රියා - වාරියපොළ | 29 | කළ්‍යාණි - හෙට්ටිපොළ | 29 | චන්ද්‍රා - අවිස්සාවේල්ල |
| 30 | එන්.අයි.ටී - යටියන්තොට | 30 | සී.කේ - කිරිදිවැල | 30 | නිව් සීගිරි - කටුගස්තොට |
| 31 | සිනේෂා - නාවලපිටිය | 31 | රීගල් - මහනුවර | 31 | ආසිරි - ඇහැලියගොඩ |
| 32 | ගාමිණි - ඇහැලියගොඩ | 32 | ගන්කන්ද - පැල්මඩුල්ල | 32 | ජයන්ති - පොලොන්නරුව |
| *33 | නිව් රජරට - මැදවච්චිය | 33 | සමූපකාර - හිගුරක්ගොඩ | 33 | නිව් රෝහණ - තිස්සමහාරාමය |
| 34 | රෙජිනා - වලස්මුල්ල | 34 | රුහුණු - තංගල්ල | 34 | ලක්මාල් - ආරච්චිකට්ටුව |
| *35 | සඳලංකා - සඳලංකාව | *35 | සුදර්ශි - ආනමඩුව | 35 | සෙන්ට්‍රල් - මාතලේ |
| 36 | සත්සර - අම්බලන්තොට | 36 | චාන්දනී - වැලිගම | *36 | එචීඑචීපී - මොනරාගල |
| 37 | නිව් විශාඛා - ඇඹිලිපිටිය | *37 | නිව් ඉන්ද්‍රාණි - වැලිමඩ | 37 | වෙලින්ටන් - කන්තලේ |
| 38 | රීගල් - දියතලාව | 38 | නිව් රිජන්ට් - රඹුක්කන | 38 | විජයන්ති 2 - කඩුවෙල |
| 39 | ස්කලයිලයිට් - මාළඹේ | 39 | මිහිර - මීරිගම | 39 | රීගල් - අම්පාර |
| 40 | එච්.ආර්. - දික්වැල්ල | 40 | අරුණ - කිරිබත්ගොඩ | | |

කොළඹ - සිටි සෙන්ටර් සිනමා ශාලා 5, කොල්ලුපිටිය - සැක්සන්, කොල්ලුපිටිය - ලිබර්ටිලයිට්, ගල්කිස්ස - සිටි සිනමා, ගම්පහ - රීගල් 1, ගම්පහ - රීගල් 2, නුවරඑළිය - රීගල් 1, නුවරඑළිය - රීගල් 2, කොළඹ - එම්.සී ප්ලැටිනම්, කොළඹ එම්.සී ගොල්ඩ් යන සිනමා ශාලා විදේශීය චිත්‍රපට ප්‍රදර්ශනය කරනු ලබන සිනමා ශාලා වන මුත් අවස්ථානකූලව සීමිත දර්ශන වාර වලදී සිංහල චිත්‍රපටද ප්‍රදර්ශනය කරනු ලැබේ.

තරු (*) ලකුණින් සලකුණු කර ඇත්තේ තාවකාලිකව වසා ඇති සිනමා ශාලා වේ.
උක්ත ධාරාවලට අයත් සිනමා ශාලා ධාරා අතර, සිනමා ශාලා හුවමාරු කිරීමේ බලය ජාතික චිත්‍රපට සංස්ථා සභාපති සතුවේ.

සාමාන්‍යාධිකාරී,
ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව.

2019.06.28 දින.

ඇමුණුම - 07

එන්එෆ්සී/114/03/47

**විශේෂිත චිත්‍රපට**

පහත සඳහන් කරුණු එකක් හෝ කිහිපයක් සපුරන චිත්‍රපට විශේෂිත චිත්‍රපට ලෙස හැඳින් වේ.

1. දේශීය චිත්‍රපට ඇගැයීම් මණ්ඩලය හා දේශීය චිත්‍රපට අනුපෙළ ගැන්වීමේ කමිටුව විසින් නිර්දේශ කරන ලද වැඩි ප්‍රේක්ෂක ආකාර්ශනයක් ලැබිය හැකි යැයි නිර්දේශිත චිත්‍රපට

2. බහුතර සිනමාශාලා වලින් අනුපෙළ ගන්වන ලෙස ඉල්ලීම් කරනු ලබන චිත්‍රපට

3. කාලීන වැදගත් කමක් සහිත තේමාවක් ඇති චිත්‍රපට

4. පිළිගත් ජාත්‍යන්තර හෝ ජාතික සම්මානයන්ට පාත්‍ර වූ චිත්‍රපට

* **"විශේෂිත චිත්‍රපටය"** - ඉහත කරුණු මත පදනම්ව අසීමිත මහජන ප්‍රදර්ශනය සඳහා සුදුසු චිත්‍රපටයක් බවට ප්‍රසිද්ධ රැගුම් පාලක මණ්ඩලය විසින් සහතික කරන ලද චිත්‍රපටයක් විය යුතුය.

සාමාන්‍යාධිකාරී,
ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව.

2019 ජූනි මස 28 දින.

ඇමුණුම - 08

NFC/114/03/47

ආනයනික චිත්‍රපට ප්‍රදර්ශනය කරනු ලබන සිනමා ශාලා

| | *සිනමා ශාලාව හා නගරය* | | |
|---|---|---|---|
| 1 | එම්.සී.ප්ලැටිනම් | - | කොළඹ 04 |
| 2 | එම්.සී.ගෝල්ඩ් | - | කොළඹ 04 |
| 3 | එම්.සී.අල්ට්‍රා | - | කොළඹ 04 |
| 4 | එම්.සී.සුපීරියර් | - | කොළඹ 04 |
| 5 | කළම්බු සිටි සෙන්ටර් 1 | - | කොළඹ 02 |
| 6 | කළම්බු සිටි සෙන්ටර් 2 | - | කොළඹ 02 |
| 7 | කළම්බු සිටි සෙන්ටර් 3 | - | කොළඹ 02 |
| 8 | කළම්බු සිටි සෙන්ටර් 4 | - | කොළඹ 02 |
| 9 | කළම්බු සිටි සෙන්ටර් 5 | - | කොළඹ 02 |
| 10 | කිංග්ස්ලි | - | කොළඹ 13 |
| 11 | කැපිටල් | - | කොළඹ 13 |
| 12 | එක්සෙල් වර්ල්ඩ් | - | කොළඹ 10 |
| 13 | එම්පයර් ඩියුලක්ස් | - | කොළඹ 07 |
| 14 | එම්පයර් ගෝල්ඩ් | - | කොළඹ 07 |
| 15 | ලිබර්ටි බයිස්කෝප් 1 | - | කොළඹ 03 |
| 16 | ලිබර්ටි බයිස්කෝප් 2 | - | කොළඹ 03 |
| 17 | සිනේසිටි 1 | - | මරදාන |
| 18 | සිනේසිටි 2 | - | මරදාන |
| 19 | සිනේසිටි 3 | - | මරදාන |
| 20 | සිනේවර්ල්ඩ් A | - | කොටහේන |
| 21 | සිනේවර්ල්ඩ් B | - | කොටහේන |
| 22 | සිනේවර්ල්ඩ් C | - | කොටහේන |
| 23 | රූබි | - | මාළිගාවත්ත |
| 24 | ඊරෝස් | - | පාමංකඩ |
| 25 | කොන්කෝඩ් | - | දෙහිවල |
| 26 | ලිබර්ටි ලයිට් | - | කොල්ලුපිටිය |
| 27 | සැක්සන් | - | කොල්ලුපිටිය |
| 28 | සැවෝයි | - | වැල්ලවත්ත |
| 29 | සැවෝයි 2 | - | වැල්ලවත්ත |
| 30 | සිටි සිනමා | - | ගල්කිස්ස |
| 31 | රීගල් සිනෙප්ලෙක්ස් 1 | - | ගම්පහ |
| 32 | රීගල් සිනෙප්ලෙක්ස් 2 | - | ගම්පහ |
| 33 | එරීනා | - | කටුගස්තොට |

ආනයනික චිත්‍රපට ප්‍රදර්ශනය කරනු ලබන සිනමා ශාලා *(සම්බන්ධිතයි)*

| | *සිනමා ශාලාව හා නගරය* | | |
|---|---|---|---|
| 34 | දිනූෂා | - | නාවලපිටිය |
| 35 | විජිත | - | හැටන් |
| 36 | ලක්මාලි | - | රාගල |
| 37 | රීගල් සිනෙප්ලෙක්ස් 1 | - | නුවරඑළිය |
| 38 | රීගල් සිනෙප්ලෙක්ස් 2 | - | නුවරඑළිය |
| 39 | එම්.සී.ප්ලැටිනම් | - | යාපනය |
| 40 | එම්.සී.සිල්වර් | - | යාපනය |
| 41 | එම්.සී.බ්‍රෝන්ස් | - | යාපනය |
| 42 | වෙල්ලා | - | යාපනය |
| 43 | රාජා 1 | - | යාපනය |
| 44 | රාජා 2 | - | යාපනය |
| 45 | ශාන්ති | - | මඩකළපුව |
| 46 | සුගන්ධි | - | මඩකළපුව |
| 47 | විජය | - | මඩකළපුව |
| 48 | සාරු | - | පේදුරුතුඩුව |
| 49 | සාළු | - | පේදුරුතුඩුව |
| 50 | සරස්වතී | - | ත්‍රිකුණාමලය |
| 51 | නෙල්සන් | - | ත්‍රිකුණාමලය |
| 52 | අන්නෙයි සෙල්ලම් | - | වෙංකලඩි |
| 53 | සෙල්ලම් ප්‍රීමියර් | - | වෙංකලඩි |
| 54 | අර්චානා | - | අක්කරපත්තුව |
| 55 | අයන් | - | මන්නාරම |
| 56 | බාලා | - | චාවකච්චේරි |
| 57 | ජී.කේ.සිනෙමැක්ස් | - | කල්මුනේ |
| 58 | කිබෙස් | - | කළුවංචිකුඩි |
| 59 | නහම්ස් | - | චුන්නාකම් |
| 60 | වසන්ති | - | වව්නියාව |

සාමාන්‍යාධිකාරී,
ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව.

2019.06.28 දින.

ඇමුණුම - 05

එන්එෆ්සී /114/03/47

**අනුපෙළ ගන්වන ලද චිත්‍රපට අනුපිළිවෙල සංශෝධනය කිරීම සලකා බැලීමට**
**පිළිගත හැකි කරුණු**

අනුපෙළ ගන්වන ලද චිත්‍රපට අනුපිළිවෙල සංශෝධනය කිරීම සඳහා සලකා බැලීමට පිළිගත හැකි කරුණු පහත පරිදි වේ.

1. ස්වභාවික ආපදා අවස්ථා

2. මිනිසා විසින් නිර්මාණය කරන ලද ආපදා අවස්ථා

3. කාලානුරූපී ගැලපීම (ජාතික/ආගමික/සංස්කෘතික වටිනාකමක් ඇති චිත්‍රපට - වෙසක් / නත්තල්/ පාසල් නිවාඩු කාල වැනි කාලයන් සඳහා )

සාමාන්‍යාධිකාරී,
ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව.

2019 ජූනි මස 28 දින.

07 - 552

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.